# "දඹදෙනි රාජ්‍ය අවධියේ ශාස්ත්‍රීය උන්නතියේ උදෙසා පාලකයන් ලබාදුන් දායකත්වය"

ජේ.එම්. සුධර්මාවති
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

වසර දෙදහස් පන්සියයක් පමණ අනාදිමත් කාලයක් තිස්සේ අතින ලාංකික අභිමානය රැඳී පැවති රජරට ශිෂ්ටාචාරයේ බිඳවැටීමත් සමඟ පාලන කේන්ද්‍රස්ථාන නිරිතදිගට සංක්‍රමණ වීම සිදුවිය. ඒ අනුව නිරිතදිග පළමු රාජධානිය වූයේ මායා රටේ පිහිටි වූ දඹදෙණියයි. දඹදෙනිය රාජධානි සමය ක්‍රි.ව. 1232 සිට ක්‍රි.ව. 1272 දක්වා වසර 40 ක් පමණ කෙටි කාලයකට සීමාවිය. එසේ වුවද මේ රාජ්‍ය අවධිය ලංකා ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයක් ලෙස සැලකේ.

පොළොන්නරුවේ රජ පැමිණි පළමුවන පරාක්‍රමබාහු රජ සමය ලංකා ඉතිහාසයේ අද්විතීය කාල පරිච්ඡේදයක් සේ සැලකේ. මේ රජතුමාගේ අභාවයේ සිට එළඹෙන කාල පරිච්ඡේදය පොළොන්නරු රාජධානියේ පරිහානි සමය වූ අතරම ලංකා ඉතිහාසය අභාග්‍ය සම්පන්න අවධියක් ලෙස හැඳින්විය හැකිය. එහි ප්‍රතිඵලයක් වූයේ ශාස්ත්‍රීය කටයුතුවල ද පරිහානියක් ඇති වීමයි. මාඝගේ බිහිසුණු ආක්‍රමණය සමග එම තත්වය වඩාත් තීව්‍ර විය. ක්‍රි. ව. 1215 දී මෙම ආක්‍රමණය සිදුවීමත් සමගම මාඝ රජරට ආධිපත්‍ය පැහැර ගැනීමට සමත් වූ හෙයින් ලාංකිකයන්ට මුහුණපෑමට සිදුවූයේ නායකත්වයක් ද අහිමි වූ ව්‍යාකූල දේශපාලන වාතාවරණයකටයි. එම පසුතලය තුළ ලාංකිකයන්ට නායකත්වය ලබා දෙමින් මහත් මෙහෙවරක් සිදු කිරීමට දඹදෙණි පාලකයෝ සමත් වූහ.

දඹදෙණි රාජධානී සමයේ දී මෙරට ශාස්ත්‍රීය කටයුතුවල පුනර්ජීවනයක් සිදුවූ බව පෙනේ. එම ශාස්ත්‍රීය ප්‍රබෝධය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. මේ සඳහා මහාවංසය, පූජාවලිය, නිකාය සංග්‍රහය යනාදී ඓතිහාසික මූලාශ්‍ර සහ ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. එමගින් එළැඹිය හැකි නිගමනය වූයේ මෙකල සිටි පාලකයන් දැක්වූ අනුග්‍රහය මෙම ශාස්ත්‍රීය ප්‍රබෝධයට බලපෑ ප්‍රධාන සාධකයක් වූ බවයි.